**ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රීලංමබැ) - 2016**

**-------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මතය

**------**

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා මුදල් නීති පනතේ 42 (2) වගන්තිය (422 අධිකාරිය) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලවීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සියලු ප්‍රමාණාත්මක කරුණුවලින් සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**---------------------**

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළවන ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට අනුකූලව බැංකුව කෙරෙහි මම ස්වාධීන වන අතර, එම අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි මාගේ වෙනත් ආචාරධර්ම වගකීම් මා විසින් සම්පූර්ණ කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මුදල් මණ්ඩලයේ වගකීම

**----------------------------**

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මෙන් යුතුව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ පැවැත්මට අදාළවන කරුණු අදාළ වන පරිදි හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගනිමින් පවත්වා ගැනීම සඳහා බැංකුවේ හැකියාව ඇගයීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වගකිව යුතු වේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ තහවුරුවක් යන්න, ඉහල මට්ටමේ තහවුරුවක් වන නමුත් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිකර හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපානු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ජාත්‍යන්තර විගණන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම. වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි හෙළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දුස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා මෙයට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත්, බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.
- යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාළත්වය හා ගිණුම්කරණ ඇස්තමේන්තු සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද අදාළ හෙළිදරව් කිරීම පිළිබඳ සාධාරණත්වය ඇගයීම.
- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ මුදල් මණ්ඩලයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට බැංකුවේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධි හෝ තත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර සැලසුම් කරන ලද විෂය පථය, විගණනයේ කාලය සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් සැලකිය යුතු සොයාගැනීම් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතය**

------------------------------

**2.1 මහා භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දේ**

------------------------------------------------------------------------------

මුදල් නීති පනතේ 39 වන වගන්තියට අනුව ලාභය මාරු කිරීමට පෙර සෑම ලැබිය යුතු ශේෂයක්ම අයකර ගත යුතුය. මහා භාණ්ඩාගාරයෙන් සහ අනෙකුත් අමාත්‍යාංශවලින් ලැබිය යුතු ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේ දී රුපියල් 1,401,497,319 ක් වුවත් 2016 වර්ෂයට අදාලව බෙදාහැරිය යුතු ලාභයෙන් රුපියල් 1,378,272,467 ක් පමණක් අයකර ගෙන තිබුණි.

**2.2 නීති, රීති,රෙගුලාසි, සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------------

| **නීති,රීති,රෙගුලාසි, සහ කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) මුදල් නීති පනතේ 39 වගන්තිය | මෙම වගන්තියේ විධිවිධානවලට අනුව, විසර්ජනයන් සහ ශ්‍රී ලංකා රජයෙන් අයවිය යුතු දෑ බේරුම් කිරීමෙන් අනතුරුව බැංකුව විසින් උපයන ලද ලාභය සෑම මූල්‍ය වසරකම අවසාන දිනයේ සිට දින 60ක් ගතවීමට පෙර මහා භාණ්ඩාගාරයට මාරු කළ යුතුය. කෙසේ වෙතත් මෙම ප්‍රතිපාදනයට පටහැනිව 2016 දෙසැම්බර් 30 වන දින මහා භාණ්ඩාගාරයට රුපියල් බිලියන 5 ක මුදලක් අත්තිකාරමක් ලෙස බැංකුවේ ලාභයෙන් ගෙවා තිබුණි.<br><br>"ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) යටතේ මූල්‍ය ඉලක්ක සපුරාලීමේ රජයේ හදිසි අවශ්‍යතාවය සලසා විශේෂිත පදනමක් මත බැංකුවේ මුදල් මණ්ඩලය විසින් රුපියල් බිලියන 5 ක ලාභයක් අත්තිකාරමක් ලෙස මාරු කිරීමට අනුමැතිය ලබා දුන් බව මුදල් මණ්ඩලයේ ලේකම්වරයා විසින් මා දැනුවත් කරන ලදී." |
| (ආ) 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරණ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | බැංකුවේ සේවකයින්ගෙන් අයකර ගැනීම වෙනුවට, ස්වකීය අරමුදල් වලින් උපයන විට ගෙවීම් බදු (PAYE) සහ බදු මත බදු ලෙස එකතුව රුපියල් මිලියන 363 ක් සහ රුපියල් මිලියන 322.6 ක් පිළිවෙළින් සමාලෝචිත වර්ෂය සඳහා සහ පසුගිය වර්ෂය සඳහා බැංකුව විසින් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය එනම් බදු පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 24,014 ක් වූ අතර පසුගිය වසරේ බදු පෙර ශුද්ධ අලාභය රුපියල් මිලියන 17,814 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රුපියල් මිලියන 41,828 ක වර්ධනයක් පිළිබිඹු විය. විශේෂයෙන් උපලබ්ධි නොවූ ලාභ ප්‍රත්‍යාගණනවල ඇතුළත් රන්, forex සහ විනිමය SWAPS පිළිවෙළින් රුපියල් මිලියන 25,612 කින් සහ රුපියල් මිලියන 17,285 කින් වර්ධනය වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

---

පසුගිය වර්ෂයේ සමස්ථ ශුද්ධ මෙහෙයුම් අලාභය වූ රුපියල් බිලියන 6.2 (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය රුපියල් බිලියන 10.6 ත් ඇතුළත්ව) හා සැසඳීමේ දී ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය වූ රුපියල් බිලියන 6.8 ත් ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ දී බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායම රුපියල් බිලියන 36 ක් වූයෙන් සමස්ථ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ආදායමෙන් සියයට 681 ක වර්ධනයක් පිළිබිඹු විය. මේ අතර, ක්ෂයවීම් හා ක්‍රමක්ෂයවීම් ඇතුළුව මෙහෙයුම් වියදම් පසුගිය වර්ශයේ දී රුපියල් බිලියන 11.6 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය රුපියල් බිලියන 11.9 ක් වීමෙන් මෙහෙයුම් වියදම්වල සියයට 2.6 ක වර්ධනයක් පිළිබිඹු විය. සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ ආදායම් සහ වියදම්වල වෙනස්වීම් පෙර වර්ෂයට සාපේක්ෂව පහත සදහන් වේ.

| | 2016 | 2015 | විචලනය {හිතකර/(අහිතකර)} | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශතය |
| **විදේශ විනිමය මූල්‍ය වත්කම් වලින් ලද ආදායම** | **26.4** | **(15.1)** | **41.5** | **274.83** |
| පොලී ආදායම | 14.9 | 13 | 1.9 | 14.62 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන (ලාභය / (අලාභය) | 9.7 | (34.8) | 44.5 | 127.87 |
| උපලබ්ධි මිල වෙනස්වීම් වලින් වූ ලාභ | 1.8 | 6.7 | (4.9) | (73.13) |
| **විදේශ විනිමය මූල්‍ය වගකීම් මත වියදම්** | **3.9** | **3.6** | **(0.3)** | **(8.33)** |
| පොලී වියදම් | 3.9 | 3.6 | (0.3) | (8.33) |
| **ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ / (අලාභ)** | **(6.8)** | **10.6** | **(17.4)** | **(164.15)** |
| **දේශීය විනිමය වත්කම්වලින් ලද සමස්ථ ශුද්ධ ආදායම / (වියදම)** | **18.8** | **0.4** | **18.4** | **4600** |
| **වෙනත් ආදායම්** | **1.5** | **1.6** | **(0.1)** | **(6.25)** |
| **මෙහෙයුම් වියදම්** | **12** | **11.6** | **(0.4)** | **(3.45)** |
| **රඳවා ගැනීමේ බදු** | **1.8** | **1.8** | **0** | **0** |
| **වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභ / (අලාභ )** | **22.2** | **(19.6)** | **41.8** | **213.26** |

විදේශ විනිමය මූල්‍ය වත්කම් වලින් ලද ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 274.8 කින් ඉහළ යෑම සහ රජයේ සුරැකුම්පත් මත පොලී ආදායම ඉහළ යාමත්, ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත් මත පොලී වියදම් පහළ යාමත් හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව දේශීය විනිමය මූල්‍ය වත්කම් වලින් ලද ආදායම සියයට 4600 කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑම සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය වැඩිවීමට හේතු විය.

**3.3** මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත නිරීක්ෂණන් කරනු ලැබේ.

(අ) බැංකුවේ ගොඩනැගිලි කුලියට දීම

මුදල් නීති පනතේ 117 වන වගන්තියට අනුව, " ශ්‍රී ලංකා මහ බැංකුව ස්වකීය හිමිකමක් සපුරා ගැනීමේදී අත්පත් කර ගන්නා සම්බන්ධතාවයක් හැර වෙළඳාමක හෝ වෙනත් ලෙසකින් වාණිජ, කාර්මික හෝ වෙනත් ව්‍යාපාර කටයුත්තක නියැලිය නොයුතුය".

මෙම විධිවිධානයට පටහැනිව, බැංකුවට අයත් පහත සඳහන් ගොඩනැගිලි අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබාදී තිබූ අතර බැංකුව විසින් කුලී ආදායම ලෙස රුපියල් 426,582,639 ක් සමාලෝචිත වර්ෂය තුළ දී උපයා තිබුණි. විස්තර පහත සඳහන් වේ.

| දේපලේ නම | කුලීයට දී තිබූ කාලපරිච්ඡේදය | බදු කරුගේ නම | මාසික කුලිය |
|---|---|---|---|
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල (බිම් මහලෙහි කොටසක්, 2 වන මහල සහ 3 වන මහල) | 2015 නොවැම්බර් 27 සිට 2016 නොවැම්බර් 26 දක්වා | මූල්‍ය අපරාධ විමර්ශන අංශය - ශ්‍රී ලංකා පොලීසිය | රුපියල්. 2,600,000 |
| බැංකුවේ ප්‍රධාන කාර්යාලය ( 4 වන සහ 5 කුළුනේ 12 වන මහල) | 2016 නොවැම්බර් 28 සිට 2018 නොවැම්බර් 27 දක්වා | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව | රුපියල්. 1,654,000 |
| බැංකුවේ ප්‍රධාන කාර්යාලය (3 වන කුළුනේ 5 වන මහළ සහ 1 වන කුළුනේ 5 වන සහ 1වන මහල) | 2016 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව | රුපියල්. 3,213,860 |
| ලොයිඩ් ගොඩනැගිල්ල | 2016 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව | රුපියල්. 6,752,500 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල ( 4 වන සහ 5 වන මහල) | 2016 පෙබරවාරි 01 සිට 2017 නොවැම්බර් මස 30 දක්වා | වෙක් පෝට් සිටි කොළඹ (පුද්ගලික) සමාගම | රුපියල්.5,187,538 (පළමු වසර) රුපියල්.5,537,373 (දෙවන වසර) |
| බැංකුවේ ප්‍රධාන කාර්යාලය (5 කුළුනේ 15 වන සහ 16 වන මහල) | 2016 දෙසැම්බර් 01 සිට 2018 නොවැම්බර් 30 දක්වා | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | රුපියල්. 2,141,480 |
| බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය - රාජගිරිය (නේවාසික කොටස) | 2016 ජූලි 01 සිට 2017 ජූනි 30 දක්වා | ශ්‍රී ලංකා විශේෂ කාර්ය බලකාය | රුපියල්. 220,000 |

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ කොටසක් | 2016 සැප්තැම්බර් 03 සිට 2017 මාර්තු 02 දක්වා | ඒබී සිකියුරිටීස් (පුද්ගලික) සමාගම | රුපියල්.230,000 |
| වයිට්වේස් ගොඩනැගිල්ල දෙවන - මහල | 2015 නොවැම්බර් 01 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා | නීතිය සහ සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | රුපියල්. 2,070,000 |
| වයිට්වේස් ගොඩනැගිල්ල බිම් මහල | 2015 නොවැම්බර් 01 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා | ණය තොරතුරු කාර්යාංශය | රුපියල්. 4,140,000 |
| මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කොටසක් | 2014 සැප්තැම්බර් 15 සිට 2017 සැප්තැම්බර් 14 දක්වා | ඒබී සිකියුරිටීස් (පුද්ගලික) සමාගම | රුපියල්. 265,816 |
| බ්‍රසීලයේ පිහිටි දේපළ | 2015 පෙබරවාරි 01 සිට 2017 ජනවාරි 31 දක්වා | විදේශ කටයුතු අමාත්‍යාංශය | එක්සත් ජනපද ඩොලර් 9,000 |
| නිව්යෝක්හි පිහිටි දේපල -USA | 2015 ජුනි 01 සිට 2017 මැයි 31 දක්වා | විදේශ කටයුතු අමාත්‍යාංශය | එක්සත් ජනපද ඩොලර් 68,000 |

මේ සම්බන්ධව පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2016 මැයි 10 වන දින බ්‍රසීලය හා නිව් යෝර්ක් වල පිහිටි දේපළ එහි වෙළඳපොළ වටිනාකමට රජයට පැවරීම සඳහා බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඉහත සඳහන් දේපල සඳහා බැංකුව විසින් සත්‍ය වශයෙන් දරා ඇති රුපියල් මිලියන 734.3 ක මුදලට විදේශීය කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට දේපල පැවරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට 2016 නොවැම්බර් 23 දින කැබිනට් මණ්ඩල විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2017 සැප්තැම්බර් මස අවසානය වන තෙක් මෙම දේපල විදේශීය කටයුතු අමාත්‍යාංශය වෙත පැවරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

ii. කුලී ගිවිසුමට ප්‍රමාද ගාස්තු ගෙවීමට අදාල වගන්තියක් ඇතුළත් කිරීමට බැංකුව අසමත් වී තිබුණි. එබැවින් නියමිත කාලයට කුලී අයකර ගැනීමට බැංකුව සමත් වී නොතිබුණි. ඇතැම් මාසික කුලී දින 104 සිට දින 254 දක්වා වූ සැලකිය යුතු ප්‍රමාදයක් සහිතව ලැබී ඇති බව නියැදි පරීක්ෂණයකින් අනාවරණය වී තිබුණි .

(ආ) උපදේශක සභාව සඳහා වන උපදේශන සේවා පිරිවැය

2014 ජුනි 28 දින උතුරු හා නැගෙනහිර පළාත්වල පදිංචි අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා ත්‍රිපුද්ගල අන්තර්ජාතික ප්‍රවීණයන්ගෙන් සමන්විත උපදේශක සභාවක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් 2014 ජුනි 28 දින පත් කර තිබූ අතර මෙය 2014 ජුලි 15 දිනැති අංක 1871/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් කර තිබුණි. උපදේශක සභාවට සහ කාර්ය මණ්ඩලයේ උපදේශක ගාස්තු, නවාතැන් හා වෙනත් ගාස්තු වැනි වියදම් සඳහා රුපියල් මිලියන 140.6 ක් සහ රුපියල් මිලියන 116.8 ක් පිළිවෙලින් 2015 සහ 2014 වර්ෂවලදී බැංකුව විසින් කිසිදු ප්‍රතිපූර්ණය කිරීමේ පදනමකින් තොරව ගෙවා තිබුණි. තවද, 2016 වර්ෂය තුළ දී උපදේශන ගාස්තු ලෙස රුපියල් මිලියන 21 ක් උපදේශක සභාව සඳහා ගෙවා තිබුණි. වියදම් කිසිදු ප්‍රතිපූර්ණය කිරීමේ පදනමකින් තොරව දරා තිබුණත් බැංකුව සහ ඉහත සඳහන් උපදේශකයින් අතර කිසිදු ගිවිසුමක් නොතිබුණි. එමෙන්ම උපදේශකවරුන් සඳහා දැරූ වියදම බැංකුවේ අරමුණුවලට බාහිර බව තවදුරටත් නිරීක්ෂණය විය.

2016 අගෝස්තු 16 දින සිට ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව රජය වෙත සේවා සැපයීම වෙනුවෙන් උපදේශකයින් වෙත ගෙවා ඇති කිසියම් වියදමක් ආපසු අයකර ගැනීමට 2016 නොවැම්බර් 01 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර එවැනි වියදම් ඒකාබද්ධ අරමුදල් වෙත බැංකුව විසින් මාරු කළ යුතු ලාභ වලින් පියවිය යුතුවේ.

(ඈ) උපදේශන සේවාවක් සඳහා ගෙවීම

මුදල් මණ්ඩලය විසින් 2015 ඔක්තෝබර් 05 දින පවත්වන ලද අංක 24/2015 හි රැස්වීමකදී මාස 6 ක ආරම්භක කාලපරිච්ඡේදයක් සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි උපදේශකයෙකුගෙන් උපදේශන සේවාවක් ලබා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. එවැනි සේවාවක් ලබා ගැනීමේ අරමුණ වන්නේ යෝජිත නව ව්‍යවස්ථාව බැංකුවට අදාල නීතිවලට අනුකූල වන බවට සහතික කිරීමයි. ඉහත සඳහන් උපදේශකවරයාට දීමනා, නවාතැන්, ආහාර සහ ආපසු යාම සඳහා ගුවන් ටිකට්පත් ලබා දීම ආදිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී සහ පසුගිය වර්ෂයේ දී දරණ ලද රුපියල් මිලියන 3.2 ක් සහ රුපියල් මිලියන 0.8 ක් බැංකුවේ වියදම් ලෙස සලකා තිබුණි. කෙසේ වෙතත්, ඉහත උපදේශකයාගේ උපදේශන කාර්යයන් බැංකුවේ ක්‍රියාකාරිත්වයට ඍජු සම්බන්ධයක් නොතිබුණු බව නිරීක්ෂණය විය.

අමාත්‍ය මණ්ඩල අනුමතියට අනුව, 2016 අගෝස්තු 16 දින සිට රජයට සේවා සැපයීම සඳහා උපදේශකයෙකුට බැංකුව විසින් කරන ලද ඕනෑම ගෙවීමක්, බැංකුව විසින් ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලබන ලාභයෙන් පියවා ගැනීමට අවසර ලැබී තිබුණි. කෙසේවෙතත්, උපදේශකවරයා වෙත උක්ත දිනයෙන් පසුව ගෙවීම් කරන ලද රුපියල් මිලියන 2.3 ක් සහ රුපියල් මිලියන 1.8 ක් පිළිවෙලින් බැංකුවේ වියදම් ලෙස සහ භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අමාත්‍යාංශවලින් අයවිය යුතු ලැබීම් වශයෙන් සලකා තිබුණි.

(ඇ) දෝෂ සහිත ක්‍රියාමාර්ග

ප්‍රාථමික අලෙවිකරුවෙකු සමඟ බැංකුව විසින් සිය අරමුදල් වෙළඳාම් කළ හැකි ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීම් (Tradable Reverse Repo) ආයෝජනවල ආයෝජනය කර තිබුණි. ආපසු ගන්නා සුරැකුම්පත් සම්බන්ධයෙන් කිසිදු සුරැකුම් යලි පැවරීමෙන් තොරව පාදක වූ සුරැකුම්පත් ප්‍රාථමික ගනුදෙනුකරු විසින් ආපසු ගැනීම හේතුවෙන් මෙම ආයෝජනයන් සම්බන්ධයෙන් ලංකා සිකියුර් සිස්ටම් (Lanka Secure System) හි ශූන්‍ය ශේෂයක් දක්වා තිබුණි. 2015 දෙසැම්බර් 04 දින ගන්නා ලද මුදල් මණ්ඩල තීරණය ප්‍රකාරව, සහතික ඇප නොමැතිව ඉහත සඳහන් ආයෝජනය යළි ආයෝජනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. මෙම ප්‍රාථමික ගනුදෙනුකරු සමඟ බැංකුවේ අරමුදල් මගින් සහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල් මගින් කරන ලද සහතික ඇප නොමැති ප්‍රතිමිල දී ගැනුම් ආයෝජන වටිනාකම 2017 සැප්තැම්බර් 30 දිනට රුපියල් බිලියන 2.4 ක් විය.

බැංකුව විසින් 2012 දෙසැම්බර් 10 සහ 14 දින වලදී පවත්වන ලද පරීක්ෂණවලදී අනාවරණය කර ගන්නා ලද උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් (ඇතැම් ආයෝජකයන්ට ප්‍රමාණවත් සුරැකුම්පත් වෙන් නොකිරීම සහ දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් ලබාගැනීම (ILF) සඳහා ආයෝජකයන්ගේ සුරැකුම්පත් භාවිතා කිරීම) ඉහත ප්‍රාථමික ගනුදෙනුකරු වෙත අවවාදාත්මක ලිපි කිහිපයක් සහ 2013 ජුනි 06 දින නියෝගයක් ද නිකුත් කර තිබිය දී, මෙම ප්‍රාථමික ගනුදෙනුකරුගේ ඉහත දෝෂ සහිත ක්‍රියාවන් සඳහා බැංකුව විසින් නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා 2015 වර්ෂයේ දී මෙම ප්‍රාථමික ගනුදෙනුකරු විසින් නැවතත් එවැනි දෝෂ සහිත ක්‍රියාවන් සිදු කර තිබිණි. තවද, බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ අංශය විසින් 2015 මැයි 20 සහ 21 දින වලදී 2015 මාර්තු 31 දිනට ප්‍රාථමික ගනුදෙනුකරු පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් සිදු කර තිබුණි. ඉහත සඳහන් උල්ලංඝනයන් ඇතුළුව විවිධ රෙගුලාසි සහ නිර්දේශ උල්ලංඝනය කිරීම් ඉහත සඳහන් ස්ථානීය පරීක්ෂණය තුළ දී නිරීක්ෂණය වී තිබුණි.

ඉන් අනතුරුව, මුදල් මණ්ඩලය විසින් 2017 ජනවාරි 30 දින පැවති අංක 3/2017 දරණ රැස්වීමේදී තීරණය කරන ලද පරිදි, මහ බැංකු අධිපතිවරයා විසින් ඉහත සඳහන් ප්‍රාථමික ගනුදෙනුකරු සම්බන්ධව බැංකුවේ ක්‍රියාමාර්ග සහ මෙහෙයුම් පිළිබඳව පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර තිබුණි. සමහර අවස්ථාවන්හි දී සියළු වාර්තාකරණ මට්ටම් වලදී විචක්ෂණශීලී ආයෝජන තීරණයන් ස්ථිරවම ගෙන නොමැති බවට වූ නිගමනයට කමිටුව විසින් එළඹී තිබුණි.

කමිටුව විසින් පහත සඳහන් නිරීක්ෂණයන් ද ඉදිරිපත් කර තිබුණි.

- ඒ ඒ සමාගම්වල සම්බන්ධිත පාර්ශවයන්ගේ සහ කළමනාකාරීත්වයේ වාර්තා වල අවදානම් සහිත පැතිකඩයන් පිළිබඳව වැඩි අවධානයකින් තොරව සුපරීක්ෂකවරුන් විසින් ප්‍රාථමික ගනුදෙනුකරුවන් පිළිබඳව සිදුකරනු ලබන සියලුම පරීක්ෂණ වලදී අධීක්ෂණ අත්පත්‍රිකා අවිධිමත් ලෙස යොදා ගැනීම.

- එකම ප්‍රාථමික ගනුදෙනුකරුවකු විසින් එක සමාන දෝෂයන් අඛණ්ඩව සිදුකරන තත්ත්වයක දී මෙන්ම සියළුම ප්‍රාථමික ගනුදෙනුකරුවන් විසින් එක සමාන දෝෂයන් නැවත වරක් සිදු කරන තත්ත්වයක දී වුව ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් බරපතල අඩුපාඩුවක් ලෙස හඳුනාගෙන නොතිබීම.

- නිතරම නියාමන සහ අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබන වාතාවරණයක් තිබියදීත්, එවැනි දෝෂයන් අනාගතයේදී සැලකිය යුතු තරමේ පාඩු සහ අවදානම් ඇතිකර හැකි බවට හඳුනා ගැනීමට අපොහොසත් වීම.

- ආයෝජනයන් මධ්‍යම තැන්පතු පද්ධතියට (Central Depository System) වාර්තා කිරීමේ දී අඛණ්ඩවම දෝෂයන් හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, වැයවන පිරිවැය සහ සේවා සපයන්නෙකු සම්බන්ධීකරණය කිරීමේ අපහසුතා වැනි විවිධ හේතූන් නිසා සුරැකුම්පත් වෙළෙඳපොළේ ඇති වී ඇති අනෙකුත් සංවර්ධනයන්ට සාපේක්ෂව ප්‍රතිකර්මදායි ක්‍රියාමාර්ගයන් ඉතා මන්දගාමීව ගෙන තිබූ අතර අපේක්ෂා කරන ලද මට්ටම කරා ළඟා වී නොතිබීම.

- නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ ක්‍රමය හඳුන්වාදීමේ දී, සෙන්ට්‍රල් කවුන්ටපාටි (Central Counterparty) වැනි නව සංවර්ධනයන්ට සරිලන අනෙකුත් පාලනයන්/වාර්තාකිරීම්, නව අවදානම් තත්ත්වයන් අවම කිරීම සඳහා ප්‍රමාණවත් අයුරින් සකස් කර නොතිබීම.

- විය හැකි අවධානම්, ප්‍රධාන ප්‍රතිමිළදී ගැනුම් ගිවිසුම් අත්සන් කිරීමේ අවශ්‍යතාවය, ප්‍රධාන ප්‍රතිමිළදී ගැනුම් ගිවිසුම් හි අන්තර්ගතයන්, පසු විපරම් කිරීම සහ ගනුදෙනු කල හැකි සුරැකුම්පත් පිළිබඳ ආයෝජකයින් දැනුවත් කිරීම සඳහා ප්‍රමාණවත් ආයෝජකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබීම.

- රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කටයුතු ද ඇතුළත්ව හඳුනාගත් අධීක්ෂණ කාර්යන්ගෙන් සමන්විත පරීක්ෂණ වාර්තාවන් සහ ප්‍රතිකර්මයන් කළමනාකරණය වෙත ඉදිරිපත් කර තිබීම.

- රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික ගනුදෙනුකරුවන් නියාමනය සහ අධීක්ෂණ කිරිම සහ රජයේ සුරැකුම්පත් ඉතා සුදුසු උපකරණ ලෙස පිළිගැනීම හේතුවෙන් සියලුම දෙපාර්තමේන්තු අභ්‍යන්තර ආයෝජන කමිටු විසින් ආයෝජන තීරණ ගැනීමේ දී ඉහළම ප්‍රතිලාභ පිළිබඳව අවධානයක් යොමු කර තිබීම.

- මාසික ආයෝජන අධීක්ෂණ කමිටු රැස්වීම්වල දී පවා, අවදානම පිළිබඳ ප්‍රමාණවත් අවධානය යොමු කිරීමෙන් තොරව ප්‍රාථමික ගනුදෙනුකරුවන් විසින් පිරිනමන ලද අනුපාතයන් පිළිබඳව අවධානය යොමු කර තිබීම.

- ඉහළ කළමනාකාරිත්වය විසින් මඟ පෙන්වනු ලබන ඇතැම් දෙපාර්තමේන්තු පවා ඉහත පරිදිම කටයුතු කර තිබීම.

- කෙසේ වුවද, ආයෝජනවල සමස්ත අවදානම තක්සේරු කිරීම, ආයෝජන අධීක්ෂණ කමිටුවේ සහ අභ්‍යන්තර ආයෝජන කමිටුවේ වගකීමක් වන නමුත් එය හරියාකාරව සිදු වී නොතිබීම.

- අභ්‍යන්තර ආයෝජන කමිටු සාමාජිකයින් හෝ ආයෝජන අධීක්ෂණ කමිටු සාමාජිකයින් මධ්‍යම තැන්පතු පද්ධතියේ (Central Depository System) වාර්තාවන් පිළිබඳව හෝ පෙර අවස්ථාවන්හි දී ඔවුන්ගේ ආයෝජන සඳහා වෙන්කර ඇති සුරැකුම්පත් නිරතුරුව ම පරීක්ෂා කිරීම පිළිබඳව අවධානය යොමු කර තිබුනේ නම් අලාභයන් අවම කර ගත හැකි ව තිබීම.

- 2015ට පෙර අභ්‍යන්තර විගණනය මඟින් එවැනි කිසිදු දෝෂයන් හඳුනාගෙන නොතිබීම.

- අරමුදල් කළමනාකරණය පිළිබඳ අදාළ කාර්ය මණ්ඩලය විසින් ප්‍රමාණවත්/ සුදුසු පුහුණුවක් ලබාගෙන නොතිබීම.

(ඉ) බැරපත් (Credit Card) වියදම් නිරවුල් කිරීම

අත්තිකාරම් ගෙවීම් සම්බන්ධයෙන් බැංකුවේ මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2011 අප්‍රේල් 19 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව, ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා මුල් ඉන්වොයිසි ඉදිරිපත් කළ යුතුය. ඉහත චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනි එවකට අධිපතිවරයා විසින් බැරපත් පියවීම සඳහා ලබා ගත් අත්තිකාරම් නිරවුල් කිරීමේ දී සමාලෝචිත වර්ෂයේ දී සහ පසුගිය වර්ෂයේ දී බැරපත් මඟින් දරණ ලද පිළිවෙලින් රුපියල් 4,354,092 ක සහ රුපියල් 1,537,355 ක වියදම් වලට අදාල මුල් ඉන්වොයිසි ඉදිරිපත් කර නොමැති බව අනාවරණය විය.

එවකට අධිපතිවරයා විසින් පෞද්ගලික වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ දී සහ පසුගිය වර්ෂයේ දී පිළිවෙලින් රුපියල් 4,238,853 ක් හා රුපියල් 6,564,359 ක් නිල බැරපත් මඟින් දරා තිබුණු බව නියැදි පරීක්ෂණයකින් අනාවරණය විය. මෙම වියදම් සැළකිය යුතු ප්‍රමාදයක් සහිතව ආපසු ගෙවා තිබුණි.

### 3.4 ශ්‍රී ලංකා රාජ්‍ය ණය කළමනාකරණය සඳහා වන නියෝජිත කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව "බැංකුව" රටේ ආර්ථික හා මිල ස්ථාවරත්වය සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ස්ථාපිත කර ඇත. තවද ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා වගකීම බැංකුව විසින් දරනු ලබයි. එහිදී රජයේ වියදම අවම වන පරිදි රජයේ මුදල් අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් භාණ්ඩාගාර සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වගකීම දරනු ලබයි.

2015 පෙබරවාරි මාසයේ සිට 2016 මැයි දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ විශේෂ විගණන වාර්තාව 2016 ජූනි 29 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ඉහත විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණයන් මෙම වාර්තාවේ කොටසක් ලෙස සැළකිය යුතුය.

### 4 . පද්ධති සහ පාලන

විගණනයේ දී නිරීක්ෂණය කරන ලද පද්ධති හා පාලනවල අඩුපාඩු වරින් වර බැංකු අධිපතිවරයා වෙත දැනුම් දී ඇත. පහත දැක්වෙන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය | ප්‍රාථමික ගනුදෙනුකරුවන් විසින් නීති රීති උල්ලංඝනය කිරීම. |
| (ආ) ගෙවීම් | ප්‍රතිපූර්ණය සඳහා විධිවිධාන නොමැතිව විදේශ නීතිඥයින්ට සහ උපදේශකවරුන්ට රජය වෙනුවෙන් ගෙවීම් කිරීම. |
| (ඇ) අත්තිකාරම් නිරවුල් කිරිම | මුල් ඉන්වොයිසි නොමැතිව අත්තිකාරම් නිරවුල් කිරිම. |